# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි පළමුවන වසර පරීක්ෂණය - 2020/2021

## නර්තන හා නාට්‍ය කලා පීඨය

### ශාස්ත්‍රීය පඨනය හා ලේඛනය - <u>**DDCT 13032**</u>

කාලය :- පැ 02

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ ප්‍රශ්න පහකින් (05) සමන්විත ය.

❖ <u>එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් හෝ තෝරාගෙන ප්‍රශ්න තුනකට (03) පමණක්</u> පිළිතුරු සපයන්න.

❖ එක් එක් කොටස සඳහා පිළිතුරු සැපයීමේදී පිළිතුරු ලියන පොත් වෙන වෙනම භාවිත කළ යුතුය.

❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.

❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ. (සම්පූර්ණ ලකුණු සංඛ්‍යාව 60 කි)

---

## <u>I කොටස</u>

**01. පහත දැක්වෙන මාතෘකා අතුරින් එක් මාතෘකාවක් තෝරාගෙන වචන 200 ට නොඅඩු ශාස්ත්‍රීය රචනාවක් ලියන්න.**

01. නර්තන කලාව සහ සන්නිවේදනය
02. සෞන්දර්ය සහ සමාජය

**02. පහත දැක්වෙන ඡේදයෙහි සදොස් ඇති තැන්, නිදොස් කර නිවැරදි ශාස්ත්‍රීය ලේඛනයක් බවට සකස් කරන්න.**

සන්නිවේදනය යනු මානවයාගේ මූලික අවශ්‍යතාවයකි. මානවයාගේ සමාජ ක්‍රියාවලියේ අනිවාර්ය අංගයක් ලෙස සන්නිව්දනය හැඳින්විය හැකිය. සමාජය බිඳ නොවැටෙන පරිදි යහතින් පවත්වාගෙන යෑම සඳහා සන්නිවේදනය අවශ්‍යයි. අද මුලු විශ්වයම එකම ගම්මානයක් බවට පත්කර ගැනීමේ ශක්තිය සන්නිවේදන මාධ්‍යයන්ට ලැබී තිබේ. එය වත්මන් ලෝකයේ තාක්ශනික වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසට එක් අතකට සැලකිය හැකිය. මානව සමාජයේ අන්තර් සම්බන්ධතාවය ගොඩනගන හුයක් ලෙස සන්නිවේදනය හඳුන්වා දිය හැකිය. එසේම මනුෂ්‍ය සමාජයේ මූලික පෙළගැස්ම සන්නිවේදනය ඔස්සේ සිදුවන බව දක්නට ලැබේ. සන්නිවේදනය මිනිසාගේ අවශ්‍යතාවයකි. එබැවින් එහි හුදෙකලා පැවැත්මක් හෝ ගුප්ත ස්වභාවයක්ද දක්නට නොමැත.අප සන්නිවේදනය හැදෑරීම යනුවෙන් අදහස් කරන්නේ මිනිසා ගැන හැදෑරීමය. මිනිසා සමාජ කණ්ඩායම් සමඟ සම්බන්ධතා දක්වන ආකාරය, තොරතුරු ලබා ගන්නා ක්‍රම හා හුවමාරු කර ගන්නා ක්‍රම, ඉගෙනීම හා ඉගැන්වීම, විනෝදය ලබා ගැනීම ආදී සියල්ල සන්නිවේදන ක්‍රියාවලිය හාප්‍රතිබද්ධවී ඇත. මානව සන්නිවේදනය කුමක්දැයි හඳුනා ගැනීමට නම් අපි විසින් ජනයා එකිනෙකට සම්බන්ධ වීඇති ආකාරය සොයාබැලිය යුතුය. මිනිසා එකිනෙකා හා සම්බන්ධතා ගොඩනාඟා ගන්නේ සන්නිවේදනය මුල් කර ගෙනය. විශාල ජන පිරිසක්, ඔවුනොවුන් අතර අදහස්, තොරතුරු හුවමාරු කර ගැනීඹට ප්‍රයත්න දරනවා විය හැකිය. එහෙත් මෙම ක්‍රියාවලිය එවුන් සිතන ආකාරයෙන් ඉටු නෙවීමට පුළුවන. එසේ ඉටු නොවන්නේ ඔවුනොවුන්ගේ ජීවන අත්දැකීම්, අදහස්, ආකල්ප, විවිධාකාර වන බැවිනි. යමෙකු විසින් කියන කිසියම් දෙයක් යමෙකුට අවබෝධ කර ගත හැකි වන්නේ ඔවුනොවුන්ගේ සිතේ ඇති අදහස්, ආකල්ප, මතිමතාන්තර වල සාමාන්‍යත්වය අනුවය.

**03. පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.**

i. මා විසින් පොතක් ලියවනු ලබමි.

ii. පරාර්ථකාමී මිනිසුන් ලෝකය තවත් ලස්සන කරයි

iii. කවිහු මවන ලෝකය නවකතාකරුවෝ මවන ලෝකයට වඩා වෙනස් ය.

iv. ඔවුහු දැන් එති යි මම නොසිතමි.

v. ගුරුවරුන් දෙමව්පියෝ මෙන් හැසිරිය යුතුය

vi. ගුරුවරුන් වැඩි දෙනා පොත් ලියවති

vii. ඔහුට වටිනා වාහනයක් තිබුණේ ය.

viii. මම පොතක් කියවමින් සිටියදී ඔවුහු විහිළු කළෙමි.

xi. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අරගල කරයි.

xii. අප විසින් ඔවුහු පිළිගනිමු.

xiii. ජනමාධ්‍යකරුවන් කියන බස් ඇමතිවරු ගණන් ගන්නේ නැත

xiv. දේශීය නර්තන සම්ප්‍රදාය ලෝකයට ගෙන යා යුතු ය

xv. යුද්ධයෙන් බොහෝ මිනිසුන් අවතැන් විය

## II කොටස

04. පර්යේෂණයක් සඳහා අනුගමනය කළ යුතු පඨන විධි (කියවීම්) හඳුන්වා දෙන්න.

05. පඨනයෙන් පර්යේෂකයාට ඇති වන වාසි මොනවා ද?

**හෝ**

ශාස්ත්‍රීය ලේඛන යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

…………………. 2024.01.30